# පටුන


| අංකය | පරිච්ඡේදය | පිටු අංකය |
|---|---|---|
| **1** | **හැඳින්වීම** | |
| 1.1 | දැක්ම | 1 |
| 1.2 | මෙහෙවර | |
| 1.3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු | |
| 1.4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන් | |
| 1.5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තත්ව ප්‍රතිපත්තිය | 2 |
| 1.6 | පාලිත ආයතන | 2 |
| 1.6. 1 | දිස්ත්‍රික් සැලැස්ම | 3 |
| 1.7 | කාර්ය මණ්ඩල සැකැස්ම | 4 |
| 1.8 | දිස්ත්‍රික්කයේ තොරතුරු | 5 |
| **2** | **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල සේවා** | **6** |
| 2.1 | ආයතන අංශය | 6 |
| 2.2 | පුහුණු හා මානව සම්පත් අංශය | 6 |
| 2.3 | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය | 7 |
| 2.4 | ප්‍රවෘත්ති අංශය | 9 |
| 2.5 | දිස්ත්‍රික් සමෘද්ධි අංශය | 9 |
| 2.6 | සමාජ ආරක්ෂණ අංශය | 11 |
| 2.7 | මිනුම් ඒකක ප්‍රමිති සේවා අංශය | 11 |
| 2.8 | වෘත්තීය මාර්ගෝපදේශන අංශය | 11 |
| 2.9 | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | 12 |
| 2.10 | සංඛ්‍යා ලේඛණ අංශය | 12 |
| 2.11 | ජාතික පොහොර ලේකම් කාර්යාලය | 13 |
| 2.12 | ඵලදායිතා අංශය | 13 |
| 2.13 | සංස්කෘතික අංශය | 14 |
| 2.14 | බෞද්ධ කටයුතු අංශය | 14 |
| 2.15 | සමාජ සේවා අංශය | 14 |
| 2.16 | උපදේශන සේවා අංශය | 14 |
| 2.17 | ආපදා කළමණාකරන සම්බන්ධීකරණ අංශය | 15 |
| 2.18 | කෘෂිකර්ම අංශය | 15 |
| 2.19 | ළමා ආරක්ෂක අංශය | 15 |
| 2.20 | පාරිභෝගික අධිකාරිය | 16 |
| 2.21 | මෝටර් රථ අංශය | 16 |
| 2.22 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 16 |
| **3** | **මූල්‍යමය කාර්ය සාධනය** | **17** |
| 3.1 | වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්වීම | 17 |
| 3.2 | ප්‍රතිපාදන වලට එරෙහි වියදම | 18 |
| 3.3 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම 27201 | 19 |
| 3.4 | පොදු තැන්පත් | 19 |
| 3.5 | ආදායම් ගිණුම | 20 |
| 3.6 | භාණ්ඩාගාර අග්‍රිම ගිණුම | 20 |
| 3.7 | රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | 20 |
| 3.8 | සමාප්තිය | 21 |
| 3.9 | උපලේඛණ 02 | 22 |
| 3.10 | උපලේඛණ 03 | 23 |
| | ඩී.ජී.එස්.ඒ. 2 | 24 |
| | ඩී.ජී.එස්.ඒ. 3 | 25 |
| | ඩී.ජී.එස්.ඒ. 4 | 26 |
| | ඩී.ජී.එස්.ඒ. 4 | 27 |
| | ඩී.ජී.එස්.ඒ. 4 | 28 |
| | ඩී.ජී.එස්.ඒ 5 | 29 |
| | ඩී.ජී.එස්.ඒ 5(1) | 30 |

භාණ්ඩාගාර ලේකම්ගේ අංක පී.එෆ්/එෆ්.එස්/03 (xiv) හා 2002 සැප්තැම්බර් මස 12 වන දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 අනුව, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් මුදල් වර්ෂය සඳහා වූ කාර්යය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

## 1. හැඳින්වීම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල

1.1. දැක්ම :

පුරවැසි තෘප්තිය සඳහා වූ විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් .

### 1.2 මෙහෙවර :

**රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව සැලසුම් සහගතව සම්පත් හා ආයතන ඵලදායි ලෙස කළමණාකරනය කරමින් පුරවැසි අවශ්‍යතා තෘප්තිමත් කරන තිරසාර සංවර්ධනයක් ඇති කිරීම.**

දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි, තිරසාර සංවර්ධනයක් උදෙසා, රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වූ මනා සැලැස්මකින් යුතුව, සම්පත් හා ආයතන ඵලදායි ලෙස මෙහෙයවන්නා වූ සම්බන්ධීකරණයක් තුලින්, ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව සාධාරණව යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටු කිරීම, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙවරයි.

### 1.3. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු :

- රජයේ නියෝජිත ආයතනයක් වශයෙන් විවිධ අණපනත් වලින් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම තුලින් ජනතා අභිලාෂයන් හා අපේක්ෂාවන් ඉටු කිරීම.
- දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා මානව මූලා හා භෞතික සම්පත් කාර්යක්ෂමව මෙහෙයවීම.

### 1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන් :

- රජයේ සංවර්ධන වැඩ සටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කටයුතු සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.
- ව්‍යවස්ථාපිත අණපනත් වලින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම.
- වෙනත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල දිස්ත්‍රික් නියෝජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කය තුල නීතිය හා සාමය පවත්වාෙගන යාමටත් ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් ආරක්ෂක අංශය සමඟ මනා සබඳතාවයක් පවත්වා ගැනීම.
-
- රාජ්‍ය ආදායම ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් රාජ්‍ය ආදායම එකතු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## 1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තත්ව ප්‍රතිපත්තිය

**රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව මානව, භෞතික මූල්‍ය සම්පත් ඵලදායිවත්, කාර්යක්ෂමවත් යොදා ගනිමින් අපගේ පූරවැස් ප්‍රඥප්තියට අනුකූලව එකිනෙකාගේ තත්ව පරිපාටි පිළිබඳව මනා අවබෝධයෙන් යුතුව , ක්‍රියාකාරී සහභාගිත්වයෙන් දිස්ත්‍රික්කයේ පුරවැසියන් හට තෘප්තිමත් හා විශිෂ්ටවූත් ගුණාත්මක සේවාවක් නිරන්තර වැඩි දියුනු කරමින් අඛන්ඩව ලබාදීම අපගේ තත්ව ප්‍රතිපත්තියයි.**

## 1.6 පාලිත ආයතන :-

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ගේ මඟ පෙන්වීම, අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල පහත සඳහන් ආයතන හා අංශ ක්‍රියාත්මක වේ.

- ආයතන අංශය
- පුහුණු හා මානව සම්පත් අංශය
- දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය
- සමෘද්ධි අංශය
- සංස්කෘතික අංශය
- බෞද්ධ කටයුතු අංශය
- ළමා රක්ෂක අංශය
- සමථ පුහුණු ඒකකය
- සමාජ ආරක්ෂණ අංශය
- ප්‍රවෘත්ති අංශය
- මිණුම් ඒකක හා ප්‍රමිති සේවා අංශය
- ආපදා කළමනාකරණ අංශය
- වෘත්තීය මාර්ගෝපදේශ අංශය
- සමාජ සේවා අංශය
- මානව සම්පත් හා ඵලදායිතා ප්‍රවර්ධන අංශය
- කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය.
- සංඛ්‍යා ලේඛණ අංශය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක්
- මෝටර් රථ අංශය
- පුපුරණ ද්‍රව්‍ය අංශය
- ඉංජිනේරු අංශය
- ඉඩම් පරිහරන අංශය
- ගිණුම් අංශය

# කුරුණෑගල දිස්ත්‍රික්කය

| | |
|---|---|
| 1.ගිරිබාව | 35 |
| 2.ගල්ගමුව | 62 |
| 3.ඇහැටුවැව | 35 |
| 4.මහව | 68 |
| 5.අඹන්පොළ | 28 |
| 6.කොටවෙහෙර | 31 |
| 7.රස්නායකපුර | 28 |
| 8.නිකවැරටිය | 42 |
| 9.පොල්පිතිගම | 82 |
| 10.ඉබ්බාගමුව | 74 |
| 11.ගනේවත්ත | 42 |
| 12.රිදීගම | 113 |
| 13.මාවතගම | 71 |
| 14.මල්ලවපිටිය | 45 |
| 15.කුරුණෑගල | 54 |
| 16.මාස්පොත | 33 |
| 17.වීරඹුගෙදර | 38 |
| 18.පොල්ගහවෙල | 84 |
| 19.අලව්ව | 66 |
| 20.නාරම්මල | 54 |
| 21.කුලියාපිටිය නැගෙනහිර | 45 |
| 22.කුලියාපිටිය බටහිර | 68 |
| 23.වාරියපොල | 56 |
| 24.පඩුවස්නුවර නැගෙනහිර | 39 |
| 25.බමුණාකොටුව | 36 |
| 26. කොබෙයිගනේ | 35 |
| 27.පඩුවස්නුවර බටහිර | 64 |
| 28.බිංගිරිය | 52 |
| 29උඩුබද්දාව | 43 |
| 30.පන්නල | 87 |
| | **1610** |






## දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධාන සටහන



## 1.8 දිස්ත්‍රික්කයේ තොරතුරු

සාපේක්ෂ වශයෙන් ගත් කල කුරුණෑගල දිස්ත්‍රික්කය දිස්ත්‍රික්ක 5 කින් වට වී ඇත. එනම් උතුරින් අනුරාධපුර දිස්ත්‍රික්කයත්, නැගෙනහිරින් මාතලේ දිස්ත්‍රික්කයත්, දකුනින් ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්කත්, බස්නාහිරින් පුත්තලම දිස්ත්‍රික්කයත් වේ. දිස්ත්‍රික්කයේ නිරපේක්ෂ පිහිටීම උතුරු ඛණ්ඩාංක 228 – 333 සහ නැගෙනහිර ඛණ්ඩාංක 104 – 178 ත් අතර වෙයි.

ඓතිහාසික පසුබිම ගැන කථා කරන විට කුරුණෑගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ අන් දිස්ත්‍රික්ක වලට වඩා වැඩි සුවිශේෂී තාවයක් ගනී. එනම් රාජධානි හතරක් පැවති ලංකාවේ එකම දිස්ත්‍රික්කය ලෙස අභිමානයක් කුරුණෑගලට හිමිව තිබීමයි. පඬුවස්නුවර , කුරුණෑගල,යාපහුව,දඹදෙණිය එම රාජධානින් වන අතර මෙම රාජධානි යුග වලදී කීර්තිමත් රජවරු රැසක්ම සිටි බවට සාක්ෂි ඕනෑ තරම් හමුවේ.

දිස්ත්‍රික්කයේ ජල වහනය සලකන විට එය ප්‍රධාන වශයෙන් ගංගා ද්‍රෝණි 04 ක් මගින් ආවර්ණය වී ඇත. එනම් උතුරු ප්‍රෙද්ශයෙන් කළාඔය දෝණියද, මධ්‍යම ප්‍රදේශයෙන් මී ඔය හා දැදුරු ඔය දෝණිද, දකුණු ප්‍රදේශයෙන් මා ඔය දෝණියද වශයෙනි. මෙම ජල වහන ද්‍රෝණි තුල රාජාංගනය, උස්ගල සියඹලන්ගමුව, හක්වටුනාඔය ,කිඹුල්වානා ඔය , බතලගොඩ, මාගල්ල, පාලුකඩවල , අතරගල්ල , මැඩියාව , වෙන්නොරුව, අඹකොලවැව, ඇතුළු මහා පරිමාණ හා සුළු පරිමාණ වාරිමාර්ග ක්‍රම රාශියක් ක්‍රියාත්මක වෙයි.

දිස්ත්‍රික්කයේ මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 900 – 2200 අතර වෙයි. ඊසාන දිග මෝසම් සුළං හා නිරිත දිග මෝසම් සුළං හා සංවහන ක්‍රියාකාරිත්වය නිසා ප්‍රධාන වශයෙන් වර්ෂාපතනය ලැබෙන අතර වැඩිම ප්‍රමාණයක් ලැබෙනුයේ නිරිත දිග මෝසම් සුලං ප්‍රවාහය මගිනි.

මෙම දිස්ත්‍රික්කය කුරුණෑගල දිස්ත්‍රික්කය වෙයි. මෙය පිහිටා ඇත්තේ වයඹ පලාත තුලයි. දිස්ත්‍රික්කයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර 4812.7 කි. එනම් හෙක්ටයාර් 481270 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 කි. ග්‍රාම සේවා වසම් 1610 ක් අයත් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ගම්මාන සංඛාව 4476 ක් වන අතර ජන්ද කොට්ඨාශ 14 කි. දිස්ත්‍රික්කයේ මහ නගර සභා 01 ක් හා නගර සභා 01 ක් ඇත. ප්‍රාදේශීය සභා 19 කි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 06 කි. පාසල් 869 කි. මෙයින් 28 ක් ජාතික පාසැල් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ගුරුවරු ප්‍රමාණය 20,006 ක් වෙයි. මුළු පාර්ලිමේන්තු මන්ත්‍රි සංඛාව 15 කි. පලාත් සභා මන්ත්‍රි වරුන් 47 ක් හා ඇමතිවරු 15 කි. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සංඛාව 337 ක් වෙයි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩල ලයිස්තුව පහත පරිදි වෙයි.

| වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | පවත්නා කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 08 | 0 |
| තෘතියක මට්ටම | 02 | 02 | 0 |
| ද්විතියක මට්ටම | 36 | 36 | 0 |
| ප්‍රාථමික මට්ටම | 16 | 16 | 0 |

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අංශවල සේවා

### 2.1 ආයතන අංශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ ආයතන කටයුතු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තිහක දිස්ත්‍රික් මට්ටමේ ආයතන කටයුතු ඉටු කිරීම ආයතන අංශයේ කාර්යභාරයයි. දිස්ත්‍රික්කයේ සමස්ත පරිපාලනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ආයතනික පසුබිම ක්‍රියාත්මක කරනු ලබන්නේ ආයතන අංශය මගිනි.

01. 2012 වර්ෂය ආරම්භයේ විනය ගොනු 183 ක් පැවැති අතර, ඉන් ගොනු 08 ක වැඩ අවසන් කිරීමට හැකි විය.

02. වර්ෂය තුළ වගා ආරක්ෂාව සඳහා ගිනි අවි අයදුම්පත් 35 ක් ලැබී තිබූ අතර, එයින් සුදුසුකම් ලද අයදුම්පත් 22 ක් නිර්දේශ කර රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී. එයින් අයදුම් පත් 07 ක් සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත. වර්ෂය තුළ ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම් සංඛ්‍යාව 1586 ක් වේ. මුරකරු අවසර පත්‍ර 13 ක් නිකුත් කර ඇත. 2012 වර්ෂය තුලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත වාහන අළුත් වැඩියා කටයුතු සඳහා රු.995.319.11 ක්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත වාහන අලුත්වැඩියා කිරීම සඳහා රු.5,194,292.08 ක්ද වියදම් වී ඇත.

03. 2012 වර්ෂයේදී නවක අභ්‍යාසලාභී උපාධිධාරීන් 7434 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා එයින් 7041 ක් බඳවා ගන්නා ලදි.

04. 2012 වර්ෂයේදී පවත්වන ලද ග්‍රාම නිළධාරි කාර්යාල කලමනාකරණ තරගයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 අතරින් පලමුවන ස්ථානය පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහල ලබ්බල වසමත්, දෙවන ස්ථානය නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දන්ඩුවාව වසමත් ,3 වන ස්ථානය ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හිරිපිටිය වසමත් දිනා ගන්නා ලදි. මෙම ස්ථාන 03 ලබා ගත් ග්‍රාම නිලධාරි කාර්යාල සමස්ත ලංකා තරග සඳහා ඉදිරිපත් කර ඇතත් මෙතෙක් එහි ප්‍රතිඵල ලැබී නොමැත.

### 2.2 පුහුණු හා මානව සම්පත් අංශය

පුහුණු හා මානව සම්පත් අංශයේ අරමුණු වන්නේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට සම්බන්ධ නිලධාරීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය තුලින් ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීමයි. ඔවුන්ගේ රාජකාරි හා වගකීම් පිළිබඳව දැනුවත් කිරීමත් නිලධාරීන්ට නව තාක්ෂණය හඳුන්වාදීමත් වැඩිදුරටත් අපේක්ෂා කෙරේ.

**2012 වර්ෂයේදී මූලික පරිගනක පුහුනු පාඨමාලා 04 ක් පැවැත්වූ අතර ,සිගාස් පුහුණු පාඨමාලා 01 ක්ද පේරෝල් පුහුණු පාඨමාලා 01 ක්ද පවත්වන ලදි.**

## 2.3 දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අංශය

දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශය 2012 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිස්ත්‍රික් කාර්යාලය ලෙස දිස්ත්‍රික් ලේකම්ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. දිස්ත්‍රික්කය තුළ කෙරෙන ප්‍රධාන සංවර්ධන කටයුතුවල සම්බන්ධීකරණ ඒකකය දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශයයි.

### 01. ජාතික සවිය ගම නැගුම වැඩසටහන - 2012 – ( එක් ගමකට එක් වැඩක් )

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 හිම මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. ග්‍රාම නිලධාරී වසම් 1610 හි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 1610 ක් සඳහා රුපියල් මිලියන 1573,966,339.55 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. එයින් රුපියල් මිලියන 1010,117,540.84 වියදම් කර තිබුනි. ප්‍රතිලාභීන් 558644 කට සහන සැලසීමට හැකිවිය.

### 02. ගම නැගුම අවිච්ඡේද ව්‍යාපෘති නිමකිරීම.

2011 වර්ෂයේ අවිච්ඡේද වූ ව්‍යාපෘති 1080 ( මාර්ග,ජල සම්පාදන,සුළු වාරිමාර්ග ,මාතෘ නිවාස,පාසැල් වැසිකිලි,කැසිකිලි,පෙර පාසල්, ගොඩනැගිලි ආදිය ) ක් සඳහා රුපියල් මිලියන 289,740,498.85 ක ප්‍රතිපාදන වෙන් කරන ලද අතර එයින් රුපියල් මිලියන 274,212,646.12 ක් වියදම් දරා තිබූ අතර ප්‍රතිලාභීන් 285258 කට සහන සැලසිමට හැකිවිය.

### 03. ගම නැගුම අවිච්ඡේද බිල්පත් පියවීම.

2011 වර්ෂයේ වැඩ අවසන් කල නමුත් ප්‍රමාණවත් අක් මුදල් නොමැතිවීමෙන් ව්‍යාපෘති 893 කට අදාල රුපියල් මිලියන 168,184,806.06 ක ප්‍රතිපාදන 2012 වර්ෂයේදී ලබාදුන් අතර එයින් රුපියල් මිලියන 166,360,324.87 ක් වියදම් දැරූ අතර ප්‍රතිලාභීන් 168361 කට සහන සැලසීමට හැකිවිය.

### 04. දිවිනැගුම වැඩසටහන.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද දිවිනැගුම වැඩ සටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිවිනැගුම ප්‍රතිලාභීන් සඳහා රුපියල් මිලියන 77,474,452.35 ක් අදාල ව්‍යාපෘති වෙනුවෙන් වියදම් දරා ඇත. දිවි නැගුම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් රුපියල් 87,804,286.51 ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. නමුත් වර්ෂය අවසාන වන විට අක් මුදල් ප්‍රමානවත් නොවීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයම වියදම් නොවුවද, අච්චිජේද වූ බිල්පත් වටිනාකම රුපියල් මිලියන 43,066,789.59 ක් විය. කුරුණෑගල දිස්ත්‍රික්කය තුල දිවිනැගුම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක විය.

### 05. විමධ්‍යගත මූලධන අයවැය වැඩසටහන.

මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 15 දෙනෙක් සඳහා රු. 75,000,000.00ක්ද ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් සඳහා 2,564,500.00 ක්ද ප්‍රතිපාදන ලැබුණි. එම ප්‍රතිපාදන උපයෝගී

කරගෙන පහත සඳහන් පරිදි ව්‍යාපෘති 1491 නිම කිරීමට 2012 වසරේදී දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අංශයට හැකිවිය.

| අනුඅංකය | සංරචකය | ව්‍යාපෘතිසංඛ්‍යාව | වියදම රු. ශත. |
|---|---|---|---|
| 01 | මාර්ග | 126 | 8,030,123.05 |
| 02 | ජල සම්පාදන | 29 | 1,250,805.89 |
| 03 | අධ්‍යාපන | 179 | 5,869,110.47 |
| 04 | සෞඛ්‍ය හා සනීපාරක්ෂාව | 20 | 657,167.19 |
| 05 | වාරිමාර්ග | 12 | 562,184.00 |
| 06 | විදුලිය | 125 | 10,868,976.87 |
| 07 | ආගමික / සංස්කෘතික | 126 | 7,330,162.15 |
| 08 | සමාජ සුභසාධන | 449 | 9,772,565.22 |
| 09 | සමාජ සංවර්ධනය | 31 | 2,578,242.52 |
| 10 | ක්‍රීඩා පහසුකම් | 59 | 3,397,951.12 |
| 11 | ගොඩනැගිලි | 279 | 15,326,528.97 |
| 12 | රුකියා උත්පාදන වැඩසටහන් | 11 | 1,333,180.83 |
| 13 | වෙනත් | 45 | 1,982,812.68 |
| 14 | පරිපාලන වියදම 3% | | 2,071,921.87 |
| | එකතුව | 1491 | 71,031,733.11 |

වර්ෂය අවසානයේ 99.99% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගත් අතර අතැති බිල්පත් වශයෙන් රු.6,532,454.02 ක මුදලක් අවශ්‍ය විය.

## **06.** <u>වයඹ පළාත් මාර්ග සංවර්ධන වැඩසටහන.</u>

වයඹ පළාත් මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වයඹ පළාතේ පළාත් මාර්ග 65 ක් දුර 424.11 km කාපට් අතුරා සංවර්ධනය කිරීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ප්‍රතිපාදන සලසා තිබූ අතර ඒ සඳහා රුපියල් මිලියන 2361 ක ප්‍රතිපාදන මුදලක් ලැබුණි. 2012 වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 2350 ක වියදමින් 83% ක ප්‍රමාණයක් ඇස්ෆෝල්ට් යොදා සංවර්ධනය කර තිබුණි.

<u>අත්හැර දමන ලද අසම්පූර්ණ රජයේ දේපල පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහන</u>

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් අත්හැර දමන ලද රජයේ අසම්පූර්ණ දේපල පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහන යටතේ 2012 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා රු. 6,900,000.00 ක ප්‍රතිපාදන

කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා අනුමත කරන ලදි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් සඳහා ව්‍යාපෘති 04 ක් අනුමත කරන ලද අතර 2012.12.31 දිනට මෙම ව්‍යාපෘති සියල්ලම නිම කරන ලද අතර එහි භෞතික ප්‍රගතිය 100% ක් විය. මුදල් ප්‍රතිපාදන වෙන් වූ ආකාරය පහත දක්වමි.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කල ප්‍රතිපාදනය |
|---|---|---|
| කොටවෙහෙර | 02 | 4,500,000.00 |
| උඩුබද්දාව | 01 | 1,500,000.00 |
| පොල්ගහවෙල | 01 | 900,000.00 |
| එකතුව | 04 | 6,900,000.00 |

## 2.4 ප්‍රවෘත්ති අංශය

කුරුණෑගල දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයෙන් දිස්ත්‍රික්කයේ ආර්ථික, අධ්‍යාපනික, සංස්කෘතික වැනි සියළු සංවර්ධනාත්මක තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙත යොමු කිරීම හා දිස්ත්‍රික්කයේ විවිධ ආයතනවලින් මාධ්‍ය ආවරණයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින විට අදාල ස්ථාන වලට මාධ්‍ය වේදීන් යොමු කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව 2012 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් මාධ්‍ය ඒකකයෙන් කරනු ලැබූ කාර්යභාරයේ සාරාංශයක් පහත පරිදි වේ.

1. විවිධ දෙපාර්තමේන්තු හා ආයතන වලින් කෙරෙන සංවර්ධන වැඩ සටහන් පිලිබඳ ප්‍රවෘත්ති ,විවිධ උත්සව කටයුතු පිලිබඳ ප්‍රවෘත්ති, නිවේදන ,ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට හා වෙනත් ජන මාධ්‍යයන්ට නිකුත් කිරීම.
2. විවිධ අමාත්‍යාංශ වලින් හා ආයතන වලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කෙරෙන උත්සව කටයුතු සඳහා මාධ්‍ය සම්බන්ධීකරණය ලබාදීම.
3. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින තොරතුරු ලබාදීම.
4. විවිධ අමාත්‍යාංශ වලින් ඉල්ලා සිටින ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සම්බන්ධ තොරතුරු හා දිස්ත්‍රික්කයේ තොරතුරු ලබාදීම.
5. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ,දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව,ප්‍රමුඛ විවිධ රුස්වීම් වලට සහභාගිවී ලබාගන්නා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට හා වෙනත් ජන මාධ්‍යයන්ට නිකුත් කිරීම.

## 2.5 දිස්ත්‍රික් සමෘද්ධි අංශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ දිස්ත්‍රික් සමෘද්ධි අංශය, දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන තවත් අංශයකි. මෙම අංශයේ 2012 වර්ෂයේ කාර්ය සාධනය පහත පරිදි සාරාංශ කළ හැකිය.

2012 වර්ෂයේදි දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 151972 ක් සඳහා සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත සමෘද්ධි දීමනා පත්‍රිකා ලබා දී ඇති අතර ඒ සඳහා දරණ ලද වියදම රු. මිලියන 917 කි. ළමා හා මාතෘ පෝෂණ තත්වය යහපත් මට්ටමින් පවත්වා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කළ පෝෂණ වැඩසටහන මගින් අඩු ආදායම්ලාභී ගැබිණි හා කිරිදෙන මව්වරුන්ගේ

පෝෂණ තත්වයන් වර්ධනය කිරීම සඳහා රු. 500.00 ක් වටිනා මුද්දර 5977 ක්ද තෝරාගත් සුදුසුකම් සහිත පවුල් සඳහා ලබාදීමට 2012 වර්ෂයේදී හැකි විය.

සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන් තුළින් සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල විවිධ ආපදාවන් වෙනුවෙන් පහත සඳහන් පරිදි රු. මිලියන 13.57 ක් ගෙවීම් කර ඇත.

| ආපදා ස්වරූපය | සිද්ධි ගණන | ගෙවූ මුදල රු. මිලියන |
|---|---|---|
| මරණ | 802 | 8.02 |
| උපත් | 258 | 1.29 |
| විවාහ | 730 | 2.06 |
| රෝහල් ගත වීම් | 1503 | 2.2 |
| **එකතුව** | **3293** | **13.57** |

සමෘද්ධි "සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විශිෂ්ඨ ලෙස සමත් දරුවන් 600 කට අධ්‍යාපන කටයුතු සංවර්ධනය සඳහා රු.මිලියන 12.6 ක් ගෙවීම් කර ඇත.

භූමිතෙල් සහනාධාර වැඩ සටහන යටතේ මසකට රු. 200.00 බැගින් වන භූමිතෙල් සහණාධාරය දිස්ත්‍රික්කයේ පවුල් 46473 සඳහා ලබාදුන් අතර මේ සඳහා රුපියල් මිලියන 84 වැය කෙරිනි.

සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මගින් හඳුන්වා දී ඇති විශේෂ අරමුදලක් මගින් සිදු කරනු ලබන දිනුම් ඇදීමේ කටයුත්තක් මගින් එක් ප්‍රතිලාභියෙකුට රු.150,000.00 බැගින් ප්‍රතිලාභීන් 120 දෙනෙකුට රුපියල් මිලියන 18 ක මුදලක් ලබා දෙන ලදි.

දිවිනැගුම ජාතික වැඩ සටහනට සමගාමීව මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රකාරව සෑම ගෘහ ඒකකයක්ම සොදුරු නිවසක් බවට පත් කිරීමේ අරමුනින් ස්වයං රැකියා ආරම්භ කිරීමට අපේක්ෂා කරන හා දැනට කුඩා පරිමාණ ව්‍යාපෘති ආරම්භ කර ඇති ව්‍යවසායකින් සඳහා ආදායම් උත්පාදක ව්‍යාපෘති වැඩි දියුණු කර ගැනීම සඳහා ව්‍යාපෘති 1621 ක් සඳහා රුපියල් මිලියන 26.577 ක මූල්‍යාධාර 2012 වර්ෂය තුල ලබාදී ඇත.

තවද කිරි අස්වැන්න වැඩි කිරීමේ අරමුනින් හා යහපත් ගව සෞඛ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුනින් ගව මඩු 126 ක් සඳහා රුපියල් මිලියන 4.25 ක්ද, ශ්‍රී ලංකාව තුල අභාවයට යමින් පවතින කිතුල් කර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් කිතුල් ව්‍යාපෘති 114 ක් සඳහා සඳහා රුපියල් මිලියන 0.73 ක්ද 2012 වර්ෂය තුල වැය කර ඇත.
ග්‍රාමීය ජනතාවට යහපත් ජීවන රටාවක් සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් සැපයීමේ අරමුණින් ව්‍යාපෘති 04 ක් සඳහා ( පානීය ජල හා වාරි ) රුපියල් මිලියන 2.11 වැය කර ඇත.

දිරිය පියස නිවාස සංවර්ධන වැඩ සටහන යටතේ ස්ථිර නිවසක් නොමැති ,නිවසක අවශ්‍යතාවය ඇති ,තනිවම නිවසක් ඉදිකර ගැනීමට ශක්තියක් නොමැති පවුල් මේ සඳහා තෝරා ගන්නා ලද අතර 2012 වර්ෂය සඳහා නිවාස 332 ක් වෙනුවෙන් රුපියල් මිලියන 13 ක මුදලක් වැය කර ඇත.

ඉතිරි කිරීමේ ප්‍රධාන සාධකය සමෘද්ධි බැංකු වැඩ සටහනයි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු 120 ක් පවතින අතර මහ සංගම් 30 ක් ක්‍රියාත්මක වේ. 2012 වර්ෂයේ මුළු ඉතිරි කිරීම් රුපියල් මිලියන 5833 ක් වෙයි. බැංකු සංගම් තුලින් ප්‍රතිලාභීන් සඳහා ණය ලබා දීම සිදු කරන අතර රුපියල් මිලියන 32.72 ක මුදලක් 2012 වර්ෂයේදී ණය ලබාදී ඇත.

2012 වර්ෂය තුල මෙම දිස්ත්‍රික්කය තුල බෙදා හරින ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1106 කි. ලැබුණු මුළු අත් මුදල් ප්‍රමාණය මිලියන 1103 කි. වර්ෂය තුල මෙම දිස්ත්‍රික්කයේ මුළු වියදම රුපියල් මිලියන 1101 කි . ඉන් වැටුප් හා වේතන සඳහා රුපියල් මිලියන 23 ක් වැය වී ඇත.

## 2.6 <u>සමාජ ආරක්ෂණ අංශය</u>.

සමාජ ආරක්ෂණ අංශයට 2012 වර්ෂයේ වර්ෂයේ බඳවා ගැනීම් සංඛ්‍යාව 1805 ක් වූ අතර මුළු දායකයින් ප්‍රමාණය 71926 කි. මුදල් ඉපැයීම රුපියල් මිලියන 38,249,249.14 ක් විය.

## **2.7** <u>මිණුම් ඒකක ප්‍රමිති හා සේවා අංශය</u>

මහජනතාව විසින් ඉදිරිපත් කරන පැමිණිලි පරීක්ෂා කර, මිණුම් උපකරණ වල නිවැරදිතාව තහවුරු කිරීම තුලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම දිස්ත්‍රික් ලේකම්ට පැවරුණ තවත් වගකීමකි.

මෙම අංශයේ 2012 වසරේ කාර්යය සාධනය පහත පරිදි සාරාංශ කල හැකිවේ.

| | |
|---|---|
| සාර්ථක වැටලීම් සංඛ්‍යාව | 137 |
| පවරන ලද නඩු සංඛ්‍යාව | 122 |
| නඩු වලින් ඉපයූ ආදායම | රු. 325,500.00 |
| මුද්‍රා තැබූ මිණුම් ඒකක ගණන | 83152 |
| එමගින් ඉපයූ ආදායම | රු. 8,429,113.15 |
| සත්‍යායන කටයුතු සඳහා සහභාගිවූ වෙළඳුන් සංඛාව | 17341 |

## **2.8.** <u>වෘත්තීය මාර්ගෝපදේශ අංශය</u>

වෘත්තීය මාර්ගෝපදේශ අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ පුද්ගලයෙකුගේ දක්ෂතාවය, කුසලතාවය හා හැකියාවට ගැලපෙන වෘත්තීය කෙෂ්ත්‍රයට යාමට අවශ්‍ය මඟ පෙන්වීමත්, එම කේෂ්ත්‍රයේ දියුණුව ලබා ගැනීමට මඟ පෙන්වීමත්ය. මේ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල වෘත්තීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත.

මෙම අංශය මගින් උපදේශන ලබාදීම , අ.පො.ස. සා.පෙල, උ.පෙල සිසුන් සඳහා වැඩ සටහන් ,ගුරුවරු දැනුවත් කිරීමේ වැඩසටහන් , බාහිර හා අභ්‍යන්තර උපාධිධාරී වැඩ සටහන් , ස්වයං රැකියා පෙළඹවීමේ, වෘත්තීය අභියෝග ජය ගැනීමේ ,ව්‍යවසාය සංවර්ධන පුහුණු , අවශ්‍යතාවය මත පුහුණු ,රැකියා සමාජ හා රැකියා ගවේෂණ ආදී සටහන් 290 ක් පමණ වර්ෂය තුල පවත්වා ඇති අතර ඒ සඳහා ප්‍රතිලාභීන් 20680 ක ප්‍රමාණයක් සහභාගි වී ඇත. මෙම වැඩ සටහන් සඳහා රු.452,071.00 ක මුදලක් වියදම් වී ඇත.

## 2.9 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති අංශයකි. මෙම අංශය විසින් රැකියා විරහිත පුද්ගලයින් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීම, පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සංවර්ධනය කිරීම හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීම පිණිස විවිධ ව්‍යාපාර කළමනාකරණ හා තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙයට අමතරව ව්‍යවසායකයන් නගා සිටුවීම පිණිස මූල්‍ය, අලෙවි, තාක්ෂණික, පහසුකම් සැපයීම පිණිස විවිධ ආයතනික සම්බන්ධීකරණ කටයුතු ද කරනු ලැබේ. .

මෙම අංශය මගින් 2012 වර්ෂය තුල ආකල්ප සංවර්ධන , ව්‍යාපර ගැන්වීමේ පුහුණු , තරුණ ව්‍යවසායකත්ව , අලෙවි කලමණාකරණ පුහුණු , ගිණුම්කරණ පුහුණු , වැනි පුහුණ වැඩ සටහන් ද, අලෙවි පොල ප්‍රදර්ශන , ව්‍යාපාර සංගම් සංවර්ධන , සම්මාන උත්සව වැනි , පසු විපරම් රුස්වීම් , ව්‍යාපෘති පරීක්ෂණ වැනි වැඩ සටහන්ද , ඉලක්කගතව සිදුකර ඇත. මේ සඳහා ප්‍රතිලාභීන් 2780 ක ප්‍රමාණයක් සහභාගිත්වය දරා ඇති අතර රුපියල් මිලියන 12,091,520.42 ක මුදලක් වියදම් වශයෙන් දරා ඇත. වැඩ සටහන් වල ප්‍රගතිය 94% වැනි ඉහල මට්ටමක පැවතී ඇත.

## 2.10 සංඛ්‍යාලේඛණ අංශය

සංඛ්‍යාලේඛන අංශයේ කාර්යය භාරය වන්නේ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේදී සංවර්ධන සැලසුම් සකස් කිරීමටත්, එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමටත්, පරිපාලන කටයුතු සඳහාත් දිස්ත්‍රික් මට්ටමින් අවශ්‍ය තොරතුරු සැපයීමත්ය. මෙම තොරතුරු, සංගණනය මගින්, නියැදි සමීක්ෂණ මගින් සහ ප්‍රාථමික වාර්තාකරුවන් හා ආයතන මගින් එක් රැස් කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් සමීක්ෂණ 2012 වසරේදී සිදු කරන ලදී.**

| **සමීක්ෂණ** | | **වාර ගණන** |
|---|---|---|
| වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය | - | යල/මහ කන්න අනුව |
| ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය | - | මාසිකව |
| ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය | - | මාසිකව |
| වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය | - | වාර්ෂිකව |
| කාර්තු ගත නිෂ්පාදන කර්මාන්ත සමීක්ෂණය | - | කාර්තු අනුව |

සංඛ්‍යාලේඛන අංශය විසින් පහත සඳහන් දත්තයන් ප්‍රාථමික වාර්තාකරුවන් මගින් එක් රැස් කර ඇත.

| | | |
|---|---|---|
| වාර්ෂිකව | - | සත්වපාලන සංඛ්‍යාලේඛන |
| | - | පලාත් පාලන සංඛ්‍යාලේඛන |
| | - | ප්‍රාදේශීය ආදායම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු |
| | | මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීම |

කන්නය අනුව - කෘෂිකාර්මික භෝග පිළිබඳ සංඛ්‍යාලේඛන

මාසිකව - ප්‍රාදේශීය නිෂ්පාදන මිල, පාරිභෝගික සිල්ලර මිල කු/ගල නගරය

මාසිකව - ගොඩනැගිලි සංඛ්‍යා ලේඛණ පළාත් පාලන ආයතන මට්ටමින්

මීට අමතරව, විමධ්‍යගත කිරීමේ වැඩ පිළිවෙල යටතේ ශ්‍රම බල සමීක්ෂණ කටයුතු හා ආදායම් වියදම් සමීක්ෂණ කටයුතු පරිගණක ගත කිරීමද මෙම අංශයෙන් ඉටු කරන ලදී.

2011 ජන හා නිවාස සංගනනය 2012 වසරේදී නිම කරන ලදි. අදාල මුලික ප්‍රකාශන අවස්ථා දෙකකින් නිකුත් කර ඇත.

## 2.11 ජාතික පොහොර ලේකම් කාර්යාලය

2012 අයවැය ඇස්තමේන්තු අනුව ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් දිස්ත්‍රික්කයේ සංවර්ධන හා පුහුණු වැඩ සටහන් රාශියක් දියත් කර තිබුණි . පොහොර පනත , රජයේ පොහොර සහණාධාර ප්‍රතිපත්තිය, විධිමත් පොහාර භාවිතය , දිස්ත්‍රික්කයේ වගා ඉලක්ක, සහ පොහොර භාවිතය හඳුනා ගැනීම ආදිය පිලිබඳව මෙම වැඩ සටහන් කේන්ද්‍ර ගතව තිබූ අතර මේ සඳහා ප්‍රාදේශීය ලේකම් වරුන් , ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වරුන් , ගොවිජන සංවර්ධන නිළධාරින්, කෘ.ප.නි. සහකාර වරුන් , ගොවි සංවිධාන නිළධාරින්, සහ දිස්ත්‍රික් පොහොර මෙහෙයුම් කමිටු සාමාජිකයින් සහභාගි කරවා ගන්නා ලදි. නිලධාරින් 537 ක් මෙම කටයුතු සඳහා සහභාගි වු අතර රු.74,836. 75 ක මුදලක්ද වියදම් වශයෙන් දරා ඇත.

තවද ගුණාත්මය තහවුරු කරන ලද රසායනික පොහොර ගොවියා වෙත ලබාදීම සඳහා පොහොර සාම්පල් ලබා ගනිමින් තත්ව විශලේෂණය කිරිමේ වැඩසටහන්ද පවත්වා ඇත.

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ආකාරයට 2012 යල හා මහ කන්න සඳහා දිස්ත්‍රික්කය තුල යූරියා ,ත්‍රිත්ව සුපිරි පොස්පේට් , හා මියුරේට් ඔෆ් පොටෑෂ් මෙ.ටො.33615 ක් ගොවි ජන සේවා මධ්‍යස්ථාන 55 ක් හා සමුපාකාර සමිති,ගොවි සමාගම් මනා සම්බන්ධීකරනයකට ලක් කරමින් දිස්ත්‍රික්කයේ සියලුම ගොවීන් වෙත මෙම පොහෙරෙ සහනාධාරය බෙදා හැරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය කටයුතු කරන ලදි. මෙම පොහෙරෙ වල වෙළද පල වටිනාකම රුපියල් මිලියන 2493.5 ක් වු අතර රජය දරන ලද වියදම රුපියල් මිලියන 2258.1 ක් වු අතර ගොවීන් 225166 දෙනෙකු සඳහා පෙහොර සහනාධාරය බෙදා දෙන ලදි.

## 2.12 ඵලදායිතා අංශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඵලදායිතා අංශය මගින් ආකල්ප , පෞරුෂ සංවර්ධනය , නායකත්ව වැඩමුළු පැවැත්වීම, රාජ්‍ය ආයතන , පාසැල් , පුද්ගලික ආයතන ආදියෙහි ඵලදායිතා ප්‍රවර්ධන වැඩ සටහන් පැවැත්වීම ආදිය මුලිකව සිදු කරනු ලබයි.

## 2.13 සංස්කෘතික අංශය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංස්කෘතික අංශය සංස්කෘතික සංදර්ශන පැවැත්වීම, අන්තර් කලායතන නර්තන තරග පැවැත්වීම,සංස්කෘතික බල මණ්ඩල පිහිටුවීම,බොදු බැති ගී තරග හා අවුරුදු උත්සව සංවිධාන කටයුතු, ප්‍රාදේශීය සාහිත්‍ය නිර්මාණ කරුවන්ගේ නිර්මාණ කුසලතා නැංවීම සඳහා නිර්මාණ තරග පැවැත්වීම හා දිස්ත්‍රික් සාහිත්‍ය උත්සවය පැවැත්වීම ප්‍රධාන කොට සැලකිය හැකියි. 2012 දිස්ත්‍රික් සාහිත්‍ය උත්සවය සඳහා වූ මුදල් ප්‍රතිපාදන සංස්කෘතික දෙපාර්තමේන්තුව වසින් හා ප්‍රදාන අනුග්‍රාහක භවතුන් වූ මහජන බැංකුව හා ලංකා බැංකුව මගින් දරන ලදි. එහි වියවම රු.112,250.00 ක් විය.

තවද පූර්ව ළමා විය මානසික සංවර්ධනය උදෙසා පෙර පාසල් ගුරුවරුන් සඳහා රස වින්දන වැඩ සටහන් පවත්වන ලද අතර මෙහි වියදම් සෘජුවම සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් දරන ලදි.

## 2.14 බෞද්ධ කටයුතු අංශය

මෙම අංශය මගින් 2012 වර්ෂය පුරාවට සුවිශේෂී වූ මෙහෙයක් සිදු කර ඇත. බෞද්ධ කටයුතු සමායෝජන නිළධාරින්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම, ජය පිරිත සඳහා සම්බන්ධීකරණ කටයුතු, දහම් පාසල් පෙල පොත් ලබාදීම, කපිලවස්තු සර්වඥධාතු ප්‍රදර්ශනය තිරීම සම්බන්ධයෙන් සම්බන්ධීකාරකයෙකු ලෙස කටයුතු කිරීම, දිස්ත්‍රික් නිපුනතා ඇගයීම් සඳහා විනිශ්චය මණ්ඩලයට පුහුණු වැඩ මුළු පැවැත්වීම, සති පිරිත් දේශනය සඳහා සමායෝජන කටයුතු සිදුකිරීම, ඇතුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ෛඑතිහාසික උරුමය පිළිබඳ සංයුක්ත තැටිය නිර්මානය කිරීම ඉන් ප්‍රධාන තැනත් ගනී.

විවිධ වැඩ සටහන් වලට අදාලව රු.105,190.00 මුදල් ප්‍රතිපාදන ලැබී තිබු අතර අදාල මුදල් සියල්ල වියදම් දරා තිබුණි.

## 2.15 සමාජ සේවා අංශය

සමාජ සේවාඅංශය මගින් ආබාධිතයින් ප්‍රජාවේ තබා පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහන මුලිකව සිදු කරනු ලබයි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා 2012 වර්ෂයේ රු.750,000.00 ක ප්‍රතිපාදන ලැබුනු අතර එම සම්පූර්ණ මුදලම වියදම් වශයෙන් දරා තිබුණි.

කරන ලද කාර්යයන් අතර ස්වයං රැකියා ලබාදීම්, සනිපාරක්ෂක පහසුකම් සැලසීම්, ස්ව උපකාරක සංවිධාන පිහිටුවීම්, ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් වරුන් දැනුවත් කිරීම්, ආබාධිත නිවාස ආධාර පරීක්ෂා කිරීම් ප්‍රධාන තැනක් ගනී.

## 2.16 උපදේශන සේවා අංශය

මෙම අංශය මගින් උපදේශන සේවා සැපයීම් 30 කටවැඩි ප්‍රමානයක් ප්‍රතිලාභීන් 5256 දෙනෙකු සඳහා ලබාදී ඇති අතර දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩලය ශක්තිමත් කිරීමේ වැඩ සටහන සඳහා රු. 49,760.00 ක ප්‍රතිපාදන ලැබී තිබුණි.

## 2.17 ආපදා කළමණාකරණ සම්බන්ධීකරණ අංශය

මෙම අංශයේ කාර්යය භාරය ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට බෙදා දැක්විය හැක.

1. ආපදා අවම කිරීමේ ව්‍යාපෘතීන්
2. ආපදා පෙර සූදානම් සැලසුම් සකස් කිරීම්
3. ආපදාවන් දැනුවත් කිරීම් හා පුහුණු කිරීම්
4. නියගය සඳහා කටයුතු කිරීම්
5. ගංවතුර සඳහා කටයුතු කිරීම්
6. වෙනත් ඇඳි වශයෙනි

නියගය අවම කිරීම සඳහා කුඩා වැව් එල්ලංග පද්දතියක් සංවර්ධනය කිරීම සිදුකර ඇත. ප්‍රාදේශීය ආපදා කලමනාකරණ සැලැස්ම සකස් කිරීම හා වැඩමුළු පැවැත්වීම තුලින් ආපදා පෙර සූදානම් සැලසුම් සැකසේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැනුවත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. ගංවතුර තත්වයන් පාලනය සඳහා ත්‍රිවිධ හමුදාව සමග එක්ව කටයුතු සම්බන්ධීකරණය. ඩෙන්ගු මර්ධන කටයුතු, වල් අලි උවදුරට අදාල පිලියම් යෙදී ම ආදිය ප්‍රධානත්වයේ ලා සැලකේ.

## 2.18 කෘෂිකර්ම අංශය

ජාතික භෝගනායක වැඩ සටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෘෂිකර්මාන්ත කේෂත්‍රය වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 16 ක ප්‍රතිපාදන කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ලබා දුන් අතර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරින්ගේ පූර්ණ සහයද ලබාගෙන රුපියල් මිලියන 10 ක පමන ව්‍යාපෘති දියත් කිරීමට හැකියාව ලැබුණි.

අදාල ව්‍යාපෘතීන් අතර ලොකු එණු , රතු එණු , මිරිස් ,රටකජු ,මුං , උදු , අන්නාසි , අඹ , වගාවන් ප්‍රධාන කොට සැලකිය හැකියි. තවද ගොවීන් පුහුණු කිරීම, පාංශු සංරක්ෂණ කටයුතු , ටාපොලින් වැනි උපකරණ මිලදී ගැනීම් ද සිදු කර ඇත.

## 2.19 ළමා ආරක්ෂක අංශය

අපයෝජනයෙන් තොර සොදුරු ළමා වියක් යන දැක්ම යටතේ ක්‍රියාත්මක වන දිස්ත්‍රික් ළමා ආරක්ෂක අධිකාරිය දැයේ දරුවන්ගේ ජීවිත ආලෝකවත් කරමින් ඔවුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් හා අපචාරයන්ගෙන් ආරක්ෂා කර ගනිමින් , එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන් අයිතිවාසිකම් සංරක්ෂිත කොට ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන මෙහෙවර වේ.

